# අනුලා බිසව ඉදි කැරවූ හුම්බුළුව රජ මහා විහාරය


සැතපෙන බුද්ධ ප්‍රතිමාව


සමාධි ප්‍රතිමාව


විනාශයට පත්වන බිතු සිතුවම්

**දර්ශී කලුබෝවිල**

අග්‍රබෝධි රජතුමාගේ දියණියක වන 'අනුලාවතී බිසව' විසින් හුම්බුළුව රජමහා විහාරය ඉදිකරවනු ලැබ ඇත. තම පියා අයිත්‍ය බණ්ඩාර නම් අය මැරීමේ පාපයෙන් ගොඩගනු පිණිස අනුලාවතී බිසව මෙම විහාරස්ථානය සාදවා සඟ සතු කොට පූජා කළ බවක් ඉතිහාසයෙහි සඳහන්ය.

ඉතා මතරම් පරිසරයකින් වටකොට නැගී සිටිනා වූ මෙම විහාරස්ථානය ඉතා සිසිල් වූ ලෙනක් තුළ සුසැදි අනගිභවනීය පින් බිමකි.

විහාර ලෙන තුළ නිර්මානය කර ඇති සිතුවම් හා ප්‍රතිමා වලින් නෙත උදුරා ගනුයේ එහි විශ්මිත වූ පැරැණි ශ්‍රී විභූති යයි. ඒ අතරින් මෑත භාගයේදී සිදු කරන ලද ප්‍රතිසංස්කරණයන් ද වේ.

වයඹ පළාතේ , කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් අලව්ව , ගිරිඋල්ල අංක 505 ප්‍රධාන බස් මාර්ගයේදී හමුවන හුම්බුළුව හන්දියෙන් වැව පාරෙහි හුම්බුළුව ගම්මානය තුළට සැතපුමක් පමණ ගමන් කළ පසු හුම්බුළුව රජ මහා විහාරයට පිවිසිය හැකිය.

විහාර භූමිය තුළ බ්‍රාහ්මී අක්ෂර සහිත ලිපියකි. තවද විහාරය පිහිටි ගලෙහි නිර්මාණය කර ඇති ගල් ලෙනකි. එය ආවරණය කර ඇත්තේ වරිච්චි බිත්ති යොදා ගනිමිනි.

මෙම විහාරස්ථානය සතු, ( රාජ පරපුරෙන් පූජා කළ ) විහාර දේපළ විශාල ප්‍රමාණයක් තිබී ඇති අතර කාලයත් සමගම ඒවා අවට ගම්වාසීන්ගේ වාසභූමි බවට පත්ව ඇත.

මෙම පින් බිමෙහි අද දවස ඉතා දුක්බර ඉරණමකට ගොදුරුව පවතී යැයි සිතේ. එහෙයින් එහි හෙට දවස අවිනිශ්චිතය.


ලෙන තුළ විහාරය .


පැරැණි චෛත්‍යය


මැකී යන බිතු සිතුවම්